**පල්ලේපොල ප්‍රාදේශීය සභාව - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පල්ලේපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තව දුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් බැකෝ යන්ත්‍රයක් අනතුරට ලක්වීමෙන් සිදුව ඇති අලාභයෙන් නිලධාරීන් දෙදෙනෙකුගෙන් තවදුරටත් අයකර ගතයුතු එකතුව රු.575,035 ක මුදල ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම්වල ගැලපීම් කර නිවැරදි කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය . |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවීම සඳහා බිල්පත් ඉදිරිපත් නොකල සංවර්ධන ව්‍යාපෘති 66 ක ඇස්තමේන්තුගත වටිනාකම රු.44,400,000 ක් කර්මාන්ත ණයහිමියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම මත 2022 වර්ෂයේ මුල් මස තුළ වැඩ නිම කිරීමේ බලාපොරොත්තුවෙන් ණයහිමි කර ඇති බව. | |
| (ඇ) | ග්‍රාමීය මාර්ග හා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන උපයෝජනය කර ක්‍රියාත්මක කිරීම අනුමත කර තිබුණු , එහෙත් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක නොකළ ව්‍යාපෘති 33ක එකතුව රු.35,000,000 ක අගය එම අමාත්‍යාංශවලින් ලැබිය යුතු මුදලක් ලෙස සළකා කර්මාන්ත ණයගැතියන් යටතේ ගිණුම්ගත කර තිබුණි. | 2021 වර්ෂයේ ඉටු කිරීමට නොහැකි වූ ව්‍යාපෘතිවලට අදාල ණයගැතියන් යටතේ දක්වන ලද මුදල් 2022 වර්ෂයේ ජ්නල් මඟින් ඉවත් කරන බව. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය . |
| (ඈ) | 2017 සිට 2020 අතර කාල පරාසය තුළ ක්‍රියාත්මක කර ගෙවීම් අවසන් කර තිබුණු සංවර්ධන ව්‍යාපෘති 03 කට අදාළ එකතුව රු.789,675ක් කර්මාන්ත ණයහිමියන් යටතේ තවදුරටත් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ ජ්නල් සටහන් මඟින් ගැලපීම් සිදුකරන බව. | |

**1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.39,692,843 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | ලේඛන යාවත්කාලීන කර තොරතුරු සොයා බලා 2022 වර්ෂයේ නිවැරදි තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | විගණනයට අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.17,034,779 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,434,637 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) වරිපනම් හා බදු | | |
| ඒකකයක හිඟ හිටි වරිපනම් ශේෂය රු.1,500 ක් ඉක්ම වූ වරිපනම් ඒකක 76 කින් වසර 2 සිට වසර 18 අතර කාල පරාසයක සිට අය නොවී පැවත එන හිඟ හිටි වරිපනම් රු.270,224 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට අයකර නොතිබුණි. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ වරිපනම් බදු අයකළ යුතුය. |
| (ආ) වෙනත් ආදායම් | | |
| මධ්‍යම පළාතේ ප්‍රධාන ලේකම්ගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු උසාවි දඩ රු.879,638 ක් හා මුද්දර ගාස්තු රු13,938,485 ක් විය. | හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබියයුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.93,969 ක ඔටෝලෙවල් යන්ත්‍රයක්, ලීටර් 1000 ජල ටැංකියක් හා ඊට අදාළ අමතර කොටස් සහ පුස්තකාල පොත් 114 ක ඌනතාවයක් නිරීක්ෂණය විය . | ඌනතාවයන් සම්බන්ධව මු.රෙ. 104 පරීක්ෂණයන් සිදුකිරීමට පළාත් පාලන කොමසාරිස්ට යොමුකර අලාභයන් අයකර ගැනීමට කටයුතු කරන බව. | ඌනතාවයන් සම්බන්ධව නිසි පරීක්ෂාවක් සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ලැබියයුතු ගිණුම් ශේෂ 3ක එකතුව රු.2,507,161 ක් අයකරගෙන නොතිබුණු අතර, ඊට අය නොකර පවතින කාලය වසර 1 ට අඩු ශේෂය රු.1,980,083 ක් ද, වසර 1 ට වැඩි හා 5 ට අඩු ශේෂය රු.510,000ක් ද , වසර 5 ට වැඩි ශේෂය රු.17,077 ක් ද ඇතුළත්ව තිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලැබියයුතු මුදල් අයකර ගත යුතුය . |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් එකතුව රු.3,961,218 ක කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍ර 02 ක් හා වාහන 03ක් වසර 2 සිට 9 අතර කාල පරාසයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | නිශ්ක්‍රීය වත්කම් ටෙන්ඩර් කර විකිණීමට හා වෙන්දේසි කිරීමටත්, අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හැකි වත්කම් ප්‍රයෝජනයට ගැනීමටත් කටයුතු කරන බව. | අළුත්වැඩියා කළහැකි වත්කම් අලුත්වැඩියා කිරීමටත්, අනෙකුත් වත්කම් අපහරණය කිරීමටත්, කටයුතු කළ යුතුය. |

### 3.4 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පරිහරණය කරනු ලබන මැනුම් සිදුකර ඇති අක්කර 15 රූඩ් 33 පර්චස් 0.15 ක සුසාන භූමි හා වෙනත් ඉඩම් කොටස් 25 ක හා මැනුම් කටයුතු සිදුකර නොමැති සුසාන භූමි 15 ක අයිතිය පවරා ගෙන නොතිබුණි. | ඉඩම් ප්‍රතිසංස්කරණය කරන කොමිෂන් සභාව හා ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇති අතර, ඒ අනුව මැනුම් කටයුතු සිදුකර පවරා ගැනීමට කටයුතු කරන බව. | අදාල ඉඩම් කොටස් මැනුම් කටයුතු සිදුකර පවරා ගැනීමට කටයතු කළ යුතුය. |

**3.5 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 සහ 2019 වර්ෂවලදී ස්ථාන මාරු වී ගිය හා සේවය හැර ගොස් ඇති නිලධාරීන් හා සේවකයින් හතර දෙනෙකුගෙන් එකතුව රු.426,262 ක ආපදා හා උත්සව අත්තිකාරම් ණය අයකර නොතිබුණි. | කඩිනමින් ණය ශේෂ නිරවුල් කරන බව. | හිඟ ණය ශේෂ අයකර ගත යුතුය. |